# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 26 දරන
# ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1987 අංක 26 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 41/86

**1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 26 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. පහත දැක්වෙන අලුත් වගන්තිය, 7 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය 1981 අංක 13 දරන පනතේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— — 1981 අංක 13 දරන පනතේ 7අ වගන්තිය ඇතුළත් කිරීම.

" සහායක අරමුදල් පිහිටුවීම.

7අ. (1) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි නිශ්චිත කාර්ය සඳහා වූ සහායක අරමුදල් සංඛ්‍යාවක් අරමුදල යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) යම් නිශ්චිත ව්‍යාපෘතියක් හෝ කාර්යයක් ප්‍රවර්ධනය කිරීම හෝ පුළුල් කිරීම සඳහා ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ශ්‍රී ලංකාවේ හෝ යම් විදේශ රටක පෞද්ගලික තැනැත්තන්ගෙන්, ව්‍යාපාරික ආයතනවලින් හෝ ආයතනවලින් අරමුදලට ලැබෙන සියලුම මුදල් (1) වන උප වගන්තිය යටතේ ඒ කාර්ය සඳහා පිහිටුවනු ලැබූ සහායක අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, ඒ මුදල්, අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව, මණ්ඩලය විසින් එකී කාර්යය සඳහා යොදා ගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම සහායක අරමුදලක් සම්බන්ධයෙන් ම, ඒ සහායක අරමුදලේ මුදල් යොදා ගත යුතු ආකාරය පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම සඳහා අවශ්‍ය විය හැකි යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන උපදේශක මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළව මේ පනතේ ඇතුළත් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (3) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන උපදේශක මණ්ඩලයක සෑම සාමාජිකයකු සම්බන්ධයෙන් සහ ඔහුට අදාළව බලපැවැත්විය යුතු ය. ".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.